# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

## பொலிஸ் ஊடகப் பிரிவு

## POLICE MEDIA DIVISION

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2026.04.10 පැය 0550 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 581/2026 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු.</u>

***பொலிஸ் ஊடகப் பிரிவிற்கு கிடைத்த முக்கிய தகவல்கள்***

**01. මනුෂ්‍ය ඝාතනයක් - හෝමාගම පොලිස් වසම.**

2026.04.09 දින රාත්‍රී හෝමාගම පොලිස් වසමේ මොරගහහේන මාර්ගයේ හෝටලයක පුද්ගලයෙකු මියගොස් සිටින බවට හෝමාගම පොලිස් ස්ථානය වෙත ලද තොරතුරක් මත සිදුකළ විමර්ශනයේදී මෙම මරණය යම්කිසි පිරිසක් විසින් පහරදීමකින් සිදුවූ මනුෂ්‍ය ඝාතනයක් බවට අනාවරණය වී ඇත.

**මරණකරු අවුරුදු 19 ක් වූ නිකදළුපොත, වැල්ලව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අදාල හෝටලයේ හෝමාගම හරිත විශ්වවිද්‍යාලයේ සිසුන් පිරිසක් විසින් පවත්වනු ලැබූ සාදයක් අතරතුරදී ඇති වූ බහින්බස්වීමක් මත සිදු වූ පහරදීමකින් මෙම මනුෂ්‍ය ඝාතනය සිදුව ඇති බවට දැනට සිදුකරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත.

මෘත ශරීරය සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් පරීක්ෂණය සිදු කිරීමට නියමිතව ඇත. සැකකරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා හෝමාගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

***கொலைச் சம்பவம் – ஹோமாகம பொலிஸ் பிரிவு***

*2026.04.09 அன்று இரவு, ஹோமாகம பொலிஸ் பிரிவிற்குட்பட்ட மொரகஹஹேன வீதியில் உள்ள ஒரு ஹோட்டலில் ஒருவர் உயிரிழந்த நிலையில் காணப்பட்டதாக கிடைத்த தகவலின் அடிப்படையில் மேற்கொண்ட விசாரணையில், இது சிலரால் தாக்கப்பட்டு நிகழ்ந்த கொலை என தெரியவந்துள்ளது.*

*உயிரிழந்தவர் 19 வயதுடைய நிக்கதலுபொத்த, வெல்லவ பகுதியைச் சேர்ந்தவர்.*

*அந்த ஹோட்டலில் ஹோமாகம ஹரித பல்கலைக்கழக மாணவர்கள் சிலர் கலந்து கொண்டிருந்த ஒரு நிகழ்வின்போது ஏற்பட்ட வாக்குவாதம் தாக்குதலாக மாறியதில் இக் கொலை நிகழ்ந்ததாக ஆரம்ப விசாரணைகளில் தெரியவந்துள்ளது.*

மரண விசாரணை (நீதிவான் பரிசோதனை) மேற்கொள்ள திட்டமிடப்பட்டுள்ளது. சந்தேக நபர்களை கைது செய்ய ஹோமாகம பொலிஸார் மேலதிக விசாரணைகளை மேற்கொண்டு வருகின்றனர்.

**02. දියේ ගිලී පුද්ගලයෙකු ජීවිතක්ෂයට - කොක්කඩිචෝලය පොලිස් වසම.**

2026.04.09 දින රාත්‍රී කොක්කඩිචෝලය පොලිස් වසමේ මුදලිකුඩා කිඩා කලපුවේ පුද්ගලයෙකු දියේ ගිලී මියගොස් ඇති බවට කොක්කඩිචෝලය පොලිස් ස්ථානයට ලද පැමිණිල්ලක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු අවුරුදු 57 ක් වූ මුනෙක්කාඩු, කොක්කඩිචෝලය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු මසුන් ඇල්ලීම සඳහා ගොස් සිටියදී මෙලෙස දියේ ගිලී අනතුරට ලක්ව ඇති බවට දැනට සිදු කරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත.

කොක්කඩිචෝලය පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

***நீரில் மூழ்கி மரணம் – கொக்கடிச்சோலை பொலிஸ் பிரிவு***

*2026.04.09 அன்று இரவு, கொக்கடிச்சோலை பொலிஸ் பிரிவிற்குட்பட்ட முதலிகுடா குளத்தில் ஒருவர் நீரில் மூழ்கி உயிரிழந்ததாக கிடைத்த முறைப்பாட்டின் அடிப்படையில் விசாரணைகள் ஆரம்பிக்கப்பட்டன.*

*உயிரிழந்தவர் 57 வயதுடைய முணேக்காடு, கொக்கடிச்சோலை பகுதியைச் சேர்ந்தவர்.*

*மீன்பிடிக்க சென்றிருந்தபோது அவர் நீரில் மூழ்கி உயிரிழந்ததாக விசாரணைகளில் தெரியவந்துள்ளது.*

*கொக்கடிச்சோலை பொலிஸார் மேலதிக விசாரணைகளை மேற்கொண்டு வருகின்றனர்.*

**03. තීරුබදු රහිතව මෙරටට ගෙන්වන ලද බීඩිකොළ තොගයක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පමුණුගම පොලිස් ස්ථානය.**

2026.04.09 දින අළුයම පමුණුගම පොලිස් වසමේ මහවත්ත ප්‍රදේශයේදී පමුණුගම පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර තීරුබදු රහිතව මෙරටට ගෙන්වන ලද බීඩිකොළ කිලෝග්‍රෑම් 2252 ක් හා බීඩිකොළ ප්‍රවාහනය සඳහා යොදා ගත් බෝට්ටු 03 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු අවුරුදු 26 ක් වන සෙත්තපප්පාඩුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පමුණුගම පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

***தீர்வை வரியின்றி கொண்டு வரப்பட்ட பீடி இலைகளுடன் கைது – பமுனுகம பொலிஸ் நிலையம்***

2026.04.09 அன்று அதிகாலை, பமுனுகம பொலிஸ் பிரிவிற்குட்பட்ட மகாவத்த பகுதியில் மேற்கொண்ட சோதனையில், தீர்வை வரியின்றி நாட்டிற்கு கொண்டு வரப்பட்ட 2252 கிலோ பீடி இலைகள் மற்றும் அவற்றை போக்குவரத்துக்கு பயன்படுத்திய 3 படகுகளுடன் ஒருவர் கைது செய்யப்பட்டார்.

சந்தேக நபர் 26 வயதுடைய செத்தப்பாடு பகுதியைச் சேர்ந்தவர்.

பமுனுகம பொலிஸார் மேலதிக விசாரணைகளை மேற்கொண்டு வருகின்றனர்.

**04. පුරාවස්තු ලබා ගැනීමේ අරමුණින් කැණීම් කරමින් සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - සෙට්ටිකුලම පොලිස් ස්ථානය.**

2026.04.09 දින රාත්‍රී සෙට්ටිකුලම පොලිස් වසමේ ඔට්ටරාකුලම ප්‍රදේශයේදී සෙට්ටිකුලම පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර පුරාවස්තු ලබා ගැනීමේ අරමුණින් කැණීම් කරමින් සිටි සැකකරුවෙකු කැණීම් උපකරණ සමඟ අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු අවුරුදු 47 ක් වන සෙට්ටිකුලම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සෙට්ටිකුලම පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**தொல்பொருட்கள் பெறுவதற்காக அகழ்வில் ஈடுபட்டவர் கைது – செட்டிகுளம் பொலிஸ் நிலையம்**

2026.04.09 அன்று இரவு, செட்டிகுளம் பொலிஸ் பிரிவிற்குட்பட்ட ஒட்டராகுளம் பகுதியில், பண்டைய பொருட்கள் பெறும் நோக்கில் அகழ்வில் ஈடுபட்ட ஒருவர் அகழ்வு உபகரணங்களுடன் கைது செய்யப்பட்டார்.

சந்தேக நபர் 47 வயதுடைய செட்டிகுளம் பகுதியைச் சேர்ந்தவர்.

செட்டிகுளம் பொலிஸார் மேலதிக விசாரணைகளை மேற்கொண்டு வருகின்றனர்.

**05. පුරාවිද්‍යා වටිනාකමක් ඇති බවට සැකකරන භාණ්ඩ සමඟ සැකකරුවන් සිව් දෙනෙකු අත්අඩංගුවට - මදුරන්කුලිය පොලිස් ස්ථානය.**

2026.04.09 දින රාත්‍රී මදුරන්කුලිය පොලිස් වසමේ මදුරන්කුලිය නගරයේදී මදුරන්කුලිය පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් කාර් රථයක් පරීක්ෂා කර ගලකින් නිම කරන ලද උස අඩි 1 ½ ක් පමණ වන නෙළුම් මලක් හා ස්වස්ති කැටයම් සහිත පුරාවිද්‍යා වටිනාකමක් ඇති බවට සැකකරන මංජුසාවක් තුළ තිබූ මැණික් ගල් බවට සැකකරන ගල් කිහිපයක් හා වෑන් රථය සමඟ සැකකරුවන් සිව් දෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරුවන් අවුරුදු 22, 30, 32 හා 47 වයස්වල පසුවන ගල්ගමුව හා මදුරන්කුලිය ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

මදුරන්කුලිය පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

පොලිස් මාධ්‍ය කොට්ඨාසය.

## தொல்பொருள் மதிப்புடையதாக சந்தேகிக்கப்படும் பொருட்களுடன் நான்கு பேர் கைது – மதுரங்குளி பொலிஸ் நிலையம்

2026.04.09 அன்று இரவு, மதுரங்குளி பொலிஸ் பிரிவிற்குட்பட்ட நகர பகுதியில் மேற்கொண்ட சோதனையில், ஒரு காரை பரிசோதித்தபோது கல் மூலம் செய்யப்பட்ட சுமார் ½ அடி உயர தாமரை மலர் மற்றும் சுவஸ்திகா வடிவங்கள் கொண்ட தொல்பொருள் மதிப்புடையதாக சந்தேகிக்கப்படும் பெட்டி, அதில் இருந்த இரத்தினக் கற்கள் என சந்தேகிக்கப்படும் சில கற்கள் மற்றும் வேனுடன் நான்கு பேர் கைது செய்யப்பட்டனர்.

சந்தேக நபர்கள் 22, 30, 32 மற்றும் 47 வயதுடைய கல்கமுவ மற்றும் மதுரங்குளி பகுதிகளைச் சேர்ந்தவர்கள்.

மதுரங்குளி பொலிஸார் மேலதிக விசாரணைகளை மேற்கொண்டு வருகின்றனர்.

**பொலிஸ் ஊடகப் பிரிவு**